# බළන්ගොඩ නගර සභාව
## 2022-03-03 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.03.03**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | අයි.ජ්.එම්. ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

ගරු උප සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කළ අතර, බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පවසන ලදී.

**01.** බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

ඒ අනුව බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම සඳහා කැඳවන ලද ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රීනි ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ලංසුපත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණය ගරු උප සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම සඳහා ලංසුපත් 02 ක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත් දෙකම ලැබී තිබුණි. එහි දී වැඩිම ලංසු මුදල වශයෙන් එම්.ඒ. චන්ද්‍රරත්න යන අය ඉදිරිපත් කර තිබූ රු. 100,150.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගත් තීරණය ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අනතුරුව අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.50 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

එම්.ටී.එම්. රුමි,
උප සභාපති,
බළන්ගොඩ නගර සභාව.